පලාත් මාර්ග ව්‍යාපෘතිය - ඌව පළාත 2012.

------------------------------------------------

1. <u>මතය.</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැරුණු විට මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීනවලට අනුකූල වී තිබුණු බවත්ය.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>.

2.1 <u>මූල්‍ය කාර්යය සාධනය.</u>

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ - ඌව පළාත සඳහා වියදම රු.1,220,220,663 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.2,954,781,415 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, 2011 දෙසැම්බර් 31 දක්වා වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 786,036,771 | 1,470,661,140 | 2,256,697,911 |
| මාර්ග නඩත්තුව | 371,665,641 | 111,495,347 | 483,160,988 |
| උපදේශක සේවා | 111,029,406 | 135,854,039 | 246,883,445 |
| ලී බඩු හා සවි කිරීම් | 1,440,877 | 1,238,298 | 2,679,175 |
| ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් | 187,884 | 1,579,090 | 1,766,974 |
| කාර්යාලයීය උපකරණ | 3,575,947 | 2,837,774 | 6,413,721 |
| පුහුණු හා වැඩ මුළු | (294,000) | 394,000 | 100,000 |
| වර්ධක හා මෙහෙයුම් පිරිවැය | 18,005,123 | 20,596,980 | 38,602,103 |
| ප්‍රත්‍යාගණන හා අගය අඩු කිරීමේ ගිණුම | (71,426,986) | (10,095,916) | (81,522,902) |
| එකතුව | 1,220,220,663 | 1,734,560,752 | 2,954,781,415 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම.

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - ඌව පළාත, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - නැගෙනහිර පළාත සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ඒකකය - උතුරු පළාත සඳහා වෙන් වශයෙන් විශේෂ (ඩොලර්) ගිණුම් 04 ක් විවෘත කර තිබුණි. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඌව පළාත් විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 6,507,178.52 | 741,176,093 |
| **එකතු කළා** | | |
| ඌන පූර්ණය කිරීම් | 6,608,901.00 | 870,952,914 |
| විදේශ විනිමය වාසිය | - | 701,426,986 |
| | 13,116,079.52 | 1,683,555,993 |
| **අඩු කළා** | | |
| ආපසු ගැනීම් | 9,249,996.49 | 1,191,941,782 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 3,866,083.03 | 491,614,211 |

## 3. විගණන නිරීක්ෂණ.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

3.1. සමාලෝචිත වර්ෂය අවසානය වන විට සංවර්ධනය කළයුතු මාර්ග 05ක් සඳහා කාලය දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. 2012 දෙසැම්බර් 31 දිනට මාර්ග අංක යූවීඑ 04 හි භෞතික ප්‍රගතිය සියයට 99.4ක් වූ අතර, විගණන පරීක්ෂණ දිනය වූ 2013 අප්‍රේල් 24 දින වන විට එහි ප්‍රගතිය සියයට 100ක් විය. මාර්ග අංක යූවීඑ 02 හි භෞතික ප්‍රගතිය සියයට 34.68 ක පහළ මට්ටමක පැවති අතර මාර්ග අංක යූවීඑ 01, යූවීඑ 03 සහ යූවීඑ 05 මාර්ගවල භෞතික ප්‍රගතිය පහත පෙන්වා දී ඇති පරිදි සැලකිය යුතු මට්ටමක පැවතුණි.

| මාර්ග අංකය | වැඩ ආරම්භ කිරීමේ දිනය | නිම කිරීමට නියමිත දිනය | දීර්ඝ කිරීමට ලබා දුන් දින ගණන | දීර්ඝ කිරීමෙන් පසු නිම කිරීමට නියමිත දිනය | 2012 දෙසැම්බර් 31 දිනට භෞතික පගතිය | 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| ------- | ------------------- | ------------------ | ------------ | ------------------ | ------------ | ------------- |
| | | | දින | | % | % |
| UVA 01 | 2010 නොවැම්බර් 01 | 2013 ජනවාරි 01 | 272 | 2013 සැප්තැම්බර් 30 | 72.99 | 53.66 |
| UVA 02 | 2010 නොවැම්බර් 01 | 2012 නොවැම්බර් 30 | 127 | 2013 අප්‍රේල් 06 | 34.62 | 42.72 |
| UVA 03 | 2010 නොවැම්බර් 08 | 2012 නොවැම්බර් 29 | 149 | 2013 මැයි 28 | 64.69 | 49.60 |
| UVA 04 | 2010 නොවැම්බර් 26 | 2012 දෙසැම්බර් 01 | 46 | 2013 ජනවාරි 15 | 99.40 | 77.18 |
| UVA 05 | 2010 දෙසැම්බර් 05 | 2012 දෙසැම්බර් 30 | 169 | 2013 ජූනි 17 | 74.55 | 53.98 |

3.2 (අ) ටෙන්ඩර් ලියවිලිවල පළවන කොටසේ 18.3 ජේදය හා දෙවන කොටසේ ITB 18.3 (b) ජේදය අනුව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම කොන්ත්‍රාත්තුවක වලංගු කාලපරිච්ජේදයේ සිට දින 56 ට වඩා ප්‍රමාදවන්නේ නම් ඒ සඳහා කොන්ත්‍රාත්තු මිලෙහි ස්ථාවර කොටස සියයට 06 කින් වැඩි කළ යුතුය. ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තු 05ක් පිරිනැමීමට ප්‍රමාදවීම හේතුවෙන් 2013 අප්‍රේල් 30 විගණිත දින වන විට බිල්වලට අමතරව රු.17,090,718 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ටෙන්ඩර් ලියවිලිවල 14.7 ජේදයට අනුව බිල් ඉදිරිපත් කර, දින 56ක් ඇතුලත කොන්ත්‍රාත්කරුට බිල්පත් සඳහා මුදල් ගෙවිය යුතු වුවත්, බිල් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් අංක UAV - 01 දරන මාර්ග ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිරිපත් කළ බිල් අංක 23, 24, සහ 25 සඳහා රු.1,564,160 ක් ද, අංක 04 ව්‍යාපෘතිය වෙනුවෙන් ඉදිරිපත් කළ බිල් අංක 16 සහ 20 සඳහා රු.624,936 ක්ද වශයෙන් එකතුව රු.2,189,096 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන් විසින් ප්‍රමාදවීමේ ගාස්තු වශයෙන් ඉල්ලුම් කර තිබුණි.

3.3 ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලේ අංක 07 දරන ඇමුණුමේ අංක 29 හා 30 ජේදවලට අනුව අභ්‍යන්තර විගණනයන් සිදුකර එහි වාර්තා කාර්තුමය වශයෙන් ලෝක බැංකුවට හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උප කාර්යාලයට යැවිය යුතුය. කෙසේ වුවද පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3.4 යූවීඒ 05 මැඩිතලේ - කිරිවෙහෙර මාර්ගයේ 2013 අප්‍රේල් 24 දින සදු කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදී පහත කරුණු අණාවරණය විය.

(අ) කි.මී. 27+374 ස්ථානයේ රු.154,276 ක් වැය කරමින් ඉදිකර තිබූ පැති බැම්ම 2012 දෙසැම්බර් 16 දින විනාශ වී තිබූ අතර විගණිත දින වූ 2013 අපෙල් 24 දින වන විටත් එය නැවත පිළසකර කර නොතිබුණි.

(ආ) කි.මී. 3+390 ස්ථානයෙ රු.3,052,791 ක් වැයකරමින් ඉදිකර තිබූ ගල් බැම්ම 2012 දෙසැම්බර් 17 දින කඩා වැටී තිබුණු නමුත් විගණිත දින වූ 2013 අපෙල් 24 උන වන විටත් එය නැවත පිළසකර කර නොතිබුණි.

(ඇ) කි.මී. 16+868, කි.මි. 16+100 යන පිරිසුම් ස්ථාන සහ හඳුනාගත් අනෙකුත් ස්වාභාවික ජලය බැස යන ස්ථානවල කඳු කපා ඉවත් කළ පස් සහ ගල් දැමීම හේතුවෙන් ජලය ගලා යෑම අවහිර වී තිබුණි.

(ඈ) කි.මී. 2+130 ස්ථානයේ මාර්ගයට මායිම්ව නිවසක් පිහිටීම නිසා කි.මී.2+130 ස්ථානයේ මාර්ගයේ පළල මීටර් 3ක් වූ අතර, එය අනාගත ගමනාගමනය සඳහා බාධාවක් විය හැකිව තිබුණි. කෙසේ වුවද 2013 අප්‍රේල් 24 වන විටත් එය ඉවත්කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.5. යූවීඒ 04 හග්ගල - ෆෝඩ්මැක්ඩොනල්ඩ් මාර්ගයේ කි.මී. 3+800 ස්ථානය නාය යාම හේතුවෙන් මීටර් 23 ක් පමණ මාර්ගය ගිලාබැස තිබුණි. තවදුරටත් කි.මී. 7+900 සිට 7+950 ස්ථානයේ මාර්ග උරහිස් සේදීගොස් තිබුණි.

3.6. අංක යූවීඒ 01 කෝට්ටේගොඩ - යාලගමුව මාර්ගයේ කි.මි.07+370 සහ කි.මි. 07+540 අතර ප්‍රදේශය 2010 වර්ෂයේ දී නාය යාම හේතුවෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක එන්බීආර්ඕ/2011/01 සහ 2011 පෙබරවාරි 10 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ ලැබෙන තෙක් මෙම මාර්ගයේ කොටසක ඉදිකිරීම නවතා තිබුණි. මේ සම්බන්ධයෙන් නිර්දේශ ලබාදෙන ලෙස පළාත් ව්‍යාපෘති නිලධාරීන් විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් ඉල්ලා සිටියද 2013 අප්‍රෙල් 24 දින වන තෙක් සුදුසු නිර්දේශයන් ලැබී නොතිබුණ. මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සිදුකරන අතරතුර මාර්ගයේ දෙපසේම දූවිලි දක්නට ලැබුණි. එම නිසා දූවිල්ලෙන් පරිසරය දූෂණය වී තිබුණි. පාරිසරික කළමනාකරණ ක්‍රියාකාරී සැළැස්ම අනුව පරිසර දූෂණය වැළැක්වීමට කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.